# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

RG/MBD/01/76

මගේ අංකය
எனது இல.
My No.

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. 565

ඔබේ අංකය
உமது இல.
Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය
திகதி
Date 2021.07. 05

සියළුම ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

**අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සිදු කරනු ලබන භාෂා පරිවර්තන කාර්යය සම්බන්ධවයි.**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උප්පැන්න, විවාහ හා මරණ සහතික පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද විභාගයකින් සමත් විය යුතු අතර අධිකරණ අමාත්‍යාංශයේ අනුමැතිය මත මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන සුදුසුකම්ලත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් ඒ සඳහා පත්කර ඇත.

02. එසේ පත්වීම් ලද නිලධාරීන්ට මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උප්පැන්න, විවාහ හා මරණ සහතික සිංහල/ඉංග්‍රීසි/දෙමළ භාෂාවෙන් පරිවර්තනය සඳහා අවසර ලබා දී ඇති අතර ඒ අනුව රජයේ අනුමත ගාස්තුව අයකර ලි.ප.අ. 86 දරන පොදු ආකෘතිය මගින් ලදු පතක් නිකුත් කර පරිවර්තන කටයුතු සිදු කරනු ලැබේ. එසේම එදිනෙදා පරිවර්තනය සඳහා ලැබෙන සහතික වලට අදාලව ලි.ප. ආ. 150 පෝරමය පුරවා එය ලැබෙන පිළිවෙළ අනුව දින පොතට ඇතුළත් කිරීම ද සිදු කරනු ලබයි.

03. තව ද මෙම පරිවර්තන කටයුතු සඳහා දිවුරුම් දී ඇති භාෂා පරිවර්තකයින් රාජකාරි වේලාව තුළ දී භාෂා පරිවර්තන කටයුතු නොකළ යුතු අතර, පරිවර්තනවල යම් නිවැරදි කිරීමක් සිදු කළ යුතු නම් හෝ හදිසි අත්‍යාවශ්‍ය හේතුවක් මත එදිනම පරිවර්තනයක් සිදු කර දිය යුතු නම් ඒ සඳහා ඉහළ මාණ්ඩලික නිලධාරියෙකුගේ නියෝගයක් මත පමණක් කටයුතු කළ යුතුය.

04. වර්තමානය වන විට බොහෝ ආයතන විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින්ම සිදු කරන ලද පරිවර්තන ඉල්ලා සිටීම හේතුවෙන් මේ පිලිබඳ බොහෝ මහජන ඉල්ලීම් ඉදිරිපත් වේ. එම නිසා සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් ලෙස මෙම දෙපාර්තමේන්තුවෙන් පත් කර ඇති අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් හට තම රාජකාරි වලට අමතරව ඉහත ක්‍රමවේදය යටතේ සහතික පරිවර්තන කටයුතු සඳහා අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙස මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත :
1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරු - කරු. දැ.ගැ.ස
2. දෙපාර්තමේන්තු සියළුම විධායක හා මාණ්ඩලික නිලධාරීන් - කරු. දැ.ගැ.ස